මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

වාර්ෂික වාර්තාව - 2021

ප්‍රවාහන අමාත්‍යාංශය
අංක . 01, ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ -10.

දැක්ම

සැමට සුරක්ෂිත මාර්ග පද්ධතියක්

මෙහෙවර

තිරසර සංවර්ධනය උදෙසා මාර්ග අනතුරුවලින් තොර සමාජයක් බිහිකිරීම.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යාලය

අංක 01, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, යන ලිපිනයේ පිහිටි ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් පරිශ්‍රයේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවා ඇත.

කාර්යාලීය ලිපිනය -

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව,
අංක . 01,
ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ -10.

දුරකතන අංකය	-	0112696890 / 0112674162 / 0112687109
ෆැක්ස් අංකය	-	0112680163
විද්‍යුත් තැපැල් ලිපිනය	-	ncrstransport@gmail.com

පටුන

වාර්ෂික වාර්තාව - 2021
(2021.01.01 සිට 2021.12.31)

විස්තරය	පිටු අංකය
හැඳින්වීම	04
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභා සාමාජික සංයුතිය	05
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්ය මණ්ඩලය	06
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුණ	07
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍යයන් හා බලතල	08
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරකම්	09 – 24
මාර්ග අනතුරු දත්ත	25- 26
මාර්ග ආරක්ෂණ අරමුදලට දායකත්වය සපයනු ලබන ලියාපදිංචි රක්ෂණ සමාගම්	27
අවසන් ගිණුම්	28 - 42
විගණකාධිපති වාර්තාව	43 - 50
විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	51 - 54

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

හැඳින්වීම

1998 අංක 05 දරන මෝටර් වාහන සංශෝධන පනතේ 213 අ සහ 213 ආ වගන්ති යටතේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනයක් ලෙස ස්ථාපනය කර ඇත. ඒ අනුව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන විෂය භාර අමාත්‍යතුමන් විසින් පත් කරනු ලබන සභාපතිවරයෙකු ඇතුළුව රාජ්‍ය ආයතන 16 ක සහ එක් රාජ්‍ය නොවන ආයතනයක නියෝජිතයෙකු ඇතුළු නියෝජිතයන් 17 කින් සමන්විත ආයතනයකි. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නියෝජනය කරන මෙම සියලු ආයතන මෙරට ප්‍රවාහන හා මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ වගකිවයුතු රාජ්‍ය ආයතන වේ. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය වන ආදායම් ලබා දෙනු ලබන්නේ ශ්‍රී ලංකාව තුල රක්ෂණ නියාමන කොමිෂන් සභාව මඟින් නියාමනය වන රක්ෂණ ආයතන මගින් වන අතර, 2004 නොවැම්බර් 24 දිනැති අංක 1368/18 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුදල පිළිබඳව සඳහන් වේ. එහි සඳහන් පරිදි , ‘‘තෘතීය පාර්ෂවයේ අවධානමක් සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි රක්ෂණ ඔප්පුවක් හෝ ඇපයක් රක්ෂණය කරන සෑම රක්ෂණ ආයතනයක් විසින්ම මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුදලට වාරික මුදලින් සියයට එකක් (1%) දායක මුදල් වශයෙන් ගෙවනු ලැබිය යුතුය.’’ ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති සියලුම රක්ෂණ සමාගම් තම ආයතන මගින් රක්ෂණය කරනු ලබන තෙවන පාර්ශවීය සියලුම වාහන සඳහා අය කෙරෙන රක්ෂණ ගාස්තු මුදලින් 1% ක වටිනාකමින් යුත් මුදල 2004 දෙසැම්බර් 01 දින සිට බලාත්මක වන පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදලට බැර කළ අතර, 2021 සැප්තැම්බර් 17 වන දින ප්‍රවාහන අමාත්‍යාතුමිය විසින් නිකුත් කරන ලද අංක 2245/31 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් එම රක්ෂණ දායකත්ව මුදල 2021 ඔක්තෝම්බර් 01 දින සිට 2% දක්වා වැඩිකර ගැනීමට කටයුතු කර ඇත.

මෙම අරමුදල මගින් ඉටු කළයුතු කාර්යභාරයන් පිළිබඳව 2005 අප්‍රේල් 04 වන දින නිකුත් කරන ලද අංක 1387/04 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කර ඇත.ඉන් එක් වගකිවයුතු ප්‍රධාන කාර්යයක් වනුයේ මාර්ග අනතුරු සිදු කර නොනවත්වා පලා යන වාහන හඳුනාගත නොහැකි බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව එම වාහන අනතුරු වලට ගොදුරු ව මියගිය හෝ ආබාධිත තත්වයට පත් පුද්ගලයන්ට සභාව මඟින් අනුමැතිය ලබා දී ඇති ආකාරයට වන්දි මුදල් ප්‍රදානය කිරීමයි.

මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම, අනතුරු අවම කිරීම, පදික හා මඟී ජීවිත අනතුරු වලට ලක්වීම වළක්වා ගැනීම, මහජනයා දැනුවත් කිරීම ඒ සඳහා අවශ්‍ය නව නීති ඇතුලත් කිරීම හෝ දැනට තිබෙන නීති සංශෝධනය කිරීම සඳහා විෂය භාර අමාත්‍යතුමන්ට උපදෙස් ලබාදීම ඇතුළු සමස්ථයක් ලෙස සියලුම පිඩාකාරී ක්‍රියා බැහැර කරමින් මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමේ කාර්යයන් සඳහා මෙම අරමුදලෙහි තැන්පත් වන මුදල් ප්‍රයෝජනයට ගතහැකි වනු ඇත.

එසේම මාර්ග ආරක්ෂාව පිළිබඳ සියලු පරිපාලන හා අනෙකුත් වියදම් දැරීම ද මෙම අරමුදල මඟින් සිදු කළ යුතුය.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා සාමාජිකයන්

01.	ආර්.එල්.ඇන්ටන් ද මෙන්ස් මහතා	-	සභාපති, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.
02.	ඒ.එම්.ආර්.ජේ.කේ.ජයසිංහ මහතා	-	ලේකම් , මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.
03.	එච්.පි. ශිරෝමි රත්නායක මෙනවිය	-	ගණකාධිකාරී, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.
04.	ආර්.එම්.එම්.රත්නායක මහතා	-	අතිරේක ලේකම් (පාසල් කටයුතු) අධ්‍යාපන අමාත්‍යාංශය.
05.	එම්.එම්.නයිමුදීන් මහතා	-	අතිරේක ලේකම් (ව්‍යාපෘති අධීක්ෂණ), පළාත් සභා හා පළාත් පාළන අමාත්‍යාංශය.
06.	සුමිත් සි.කේ. අලහකෝන් මහතා	-	මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.
07.	ආර්.ඒ.කේ රේණුකා මිය	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (දුම්රිය පාලන), ප්‍රවාහන අමාත්‍යාංශය .
08.	එච්.ඒ.කේ.ඒ.ඉන්දික හපුගොඩ මහතා	-	ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, (අධ්‍යක්ෂ,රථ වාහන පාලන හා මාර්ග ආරක්ෂාව) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව.
09.	ආචාර්ය . එච්.ආර්.පසිඳු මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය.
10.	ශශී වෙල්ගම මහතා	-	සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව.
11.	ධම්මික ආටිගල මහතා	-	සභාපති, ශ්‍රී ලංකා ඔටෝ මොබයිල් සංගමය.
12.	ගිහාන් රාමනායක මහතා	-	සභාපති, ශ්‍රී ලංකා අනතුරු වැලැක්වීමේ සංගමය.
13.	සි.පි. අයි.ද සිල්වා මිය	-	ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරී , ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව.
14.	ජී.ජී.එම්.කුලතිලක මහතා	-	ප්‍රධාන විධායක නිලධාරි, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය.
15.	කේ.එස්.එම්.සමරසේකර මිය	-	ප්‍රධාන වෛද්‍ය නිලධාරී, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය.
16.	සි.ඩබ්.සි.කේ. ධර්මසේන මහතා	-	අධ්‍යක්ෂ ජනරල්,කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,මුදල් අමාත්‍යාංශය.
17.	ජී.ඩබ්.ජී. අබේගුණවර්ධන මහතා	-	අධ්‍යක්ෂ (නාගරික සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති) නාගරික සංවර්ධන අධිකාරිය.
18.	ඩී.එම්.කේ.එස්. දිසානායක මහතා	-	අධ්‍යක්ෂ (ඉංජිනේරු),මහා මාර්ග අමාත්‍යාංශය.
19.	පි.ඒ.චන්ද්‍රපාල මහතා	-	අධ්‍යක්ෂ ඉංජිනේරු(රථ වාහන නිර්මාණ හා මාර්ග ආරක්ෂණ), කොළඹ මහ නගර සභාව .
20.	ආර්.ඒ. සුදත් මහතා	-	අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන හා මාර්ග ආරක්ෂාව කළමනාකරණය) මාර්ග සංවර්ධන අධිකාරිය.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යය මණ්ඩලය.

01.	ආර්.එල්. ඇන්ටන් ද මෙන්ස් මහතා	-	සභාපති , මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
02.	ඒ.එම්.ආර්.ජේ.කේ.ජයසිංහ මහතා	-	ලේකම් , මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (වැ.බ.)
03.	එච්.පි.ශිරෝමි රත්නායක මෙනවිය	-	ගණකාධිකාරී, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (වැ.බ.)
04.	ජේ.ඩි.ආර්.ජයසිංහ මෙනවිය	-	සංවර්ධන නිළධාරී
05.	ඊ.ජී. එස්.ඒකනායක මහතා	-	සංවර්ධන නිලධාරී
06.	කේ.ඊ.ප්‍රියරංගනී මිය	-	සංවර්ධන නිලධාරී
07.	පි.ඒ.චිත්‍රානි ජයතිස්ස මිය	-	කළමනාකරණ සේවා නිලධාරී
08.	එස්.ඒ.කේ.ඒ. සමරසිංහ මෙනවිය	-	අභ්‍යාසලාභී උපාධිධාරී
09.	ඩබ්.ඒ.ඒ.ඩබ්.වික්‍රම ආරච්චි මෙනවිය	-	අභ්‍යාසලාභී උපාධිධාරී
10.	ඩි.සි.බි.ඩි.ඩයස් මෙනවිය	-	අභ්‍යාසලාභී උපාධිධාරී
11.	එම්.ඒ.එන්.එස්. ජයතිලක මහතා	-	අභ්‍යාසලාභී උපාධිධාරී
12.	බි.පි.ඒ.රුවන් මහතා	-	ලිපිකරු
13.	කේ.එල්.ඩි.එන්.ජයවර්ධන මහතා	-	කාර්යාල සේවක සේවය
14.	ජී.ඒ.බුද්ධික ප්‍රභාත් මහතා	-	තාක්ෂණ ශිල්පී සහයක
15.	කේ.මහේෂ් සංජීව මහතා	-	තාක්ෂණ ශිල්පී සහයක
16.	කේ.ඩි.හර්ෂිකා දිල්හානි මිය	-	කාර්යාල කාර්යය සහයක
17.	ඒ.පි.ටි. හර්ෂණි සඳමාලි මිය	-	දුම්රිය කාර්ය සහයක

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුණු

- විනය ගරුක හා නීති ගරුක රියදුරන් බිහි කිරීම තුළින් ඉහළ ගුණාත්මක රියදුරු සේවාවක් බිහි කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම.

- හප්පා පලා යෑම නිසා විනිදිත වූ පවුල් සඳහා මූලාශ්‍රාධාර ලබා දීම සහ එවැනි අනතුරු අවම කිරීමට ක්‍රියා කිරීම.

- මාර්ගය සහ එය භාවිත කරන වාහන හා ගමන් ගන්නා මගීන් ඇතුළු පදිකයින්ගේ ආරක්ෂාව සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

- මාර්ග ආරක්ෂාව පිළිබඳ දත්ත එක් රැස් කිරීම, සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම සහ අන්තර් ජාතික සම්බන්ධීකරණය වර්ධනය කර ගැනීම.

- රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික ආයතන සමග එක්ව ජාතික මාර්ග ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම හා පැන නැගෙන දුර්වලතා අවම කර ගැනීම.

- මාර්ග අනතුරු නිසා ආබාධිත තත්වයට පත්වන පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

- මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම හා මාර්ග අනතුරු අවම කිරීමට අදාලව ආර්ථික තාක්ෂණික සහ සමාජීය වශයෙන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් සහ පරිසර හිතකාමී ආරක්ෂිත පියවරවල් අනුගමනය කිරීම සඳහා මූලාශ්‍රාධාර සහ උපදෙස් ලබාදීම.

- ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සැකසීමට හා එහි ක්‍රියාකාරීත්වයට දායකත්වය ලබා දීම.

- මාර්ග ආරක්ෂාවට අදාල නීති සැකසීම, සංශෝධනය වැනි ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍යයන් හා බලතල

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සතු කාර්යභාරය හා කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් බලය ලබාදී ඇත්තේ 2005 අප්‍රේල් 04 වන දින නිකුත් කරන ලද අංක 1387/4 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගිනි. එම ගැසට් පත්‍රය මගින් නියෝග කර ඇති පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් සිදුකළයුතු කර්තව්‍යයන් පහත පරිදි වේ.

(අ) පහත දැක්වෙන දෑ පිළිබඳ පරිගණක දත්ත ගබඩාවක් පවත්වා ගෙන යෑම.

I. රථ වාහන ප්‍රමාණය සහ ඒවායේ ලක්ෂණ සහ සංයුතිය.

II. මාර්ග අනතුරු

III.මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සංඛ්‍යා ලේඛන.

(ආ) මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යෑම.

(ඇ) සම්බන්ධිත විෂයයන් පිළිබඳ තොරතුරු රැස් කිරීම, පර්යේෂණ පැවැත්වීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම.

(ඈ) සම්බන්ධිත විෂයයන් පිළිබඳ පර්යේෂණ වලට ආධාර කිරීම.

(ඉ) සමාන ජාත්‍යන්තර ආයතන සමග සබඳතා පැවැත්වීම සහ පළපුරුද්ද පිළිබඳ දැනුම හුවමාර කර ගැනීම.

(ඊ) මාර්ග ආරක්ෂාව සහ සම්බන්ධිත විෂයානුබද්ධ ව්‍යාපෘති කෙරෙහි වගකීම දරන රාජ්‍ය සහ රාජ්‍ය නොවන අදාල ආයතන වලට දැනුම හා තොරතුරු ලබාදීම.

(උ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාවට නැංවීම.

(ඌ) රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.

(ඔ) හඳුනා නොගත් වාහන වලින් අනතුරට පත් තැනැත්තන්ට වන්දි ගෙවීම.

(ඕ) මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහාය ලබා ගැනීම.

(එ) මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳව රජයට උපදෙස් ලබාදීම.

2021 වර්ෂය තුළ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරකම්.

- **මාර්ග ආරක්ෂාව කළමනාකරණය**

  - **මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව , "ජාතික ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ කොමිෂන් සභාව" ලෙස ස්ථාපිත කිරීම.**

    මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ජාතික ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ කොමිෂන් සභාව ලෙස ස්ථාපිත කිරීමට අදාලව අමාත්‍ය මණ්ඩලය විසින් කොන්දේසි සහිතව අදාල කොමිෂන් සභාව පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දුන් අතර, ඊට අදාල කෙටුම්පත 2021 11.30 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

  - **2022 – 2024 වර්ෂයන් සඳහා මාර්ග රිය අනතුරු අවම කිරීමට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම.**

    2022 – 2024 වර්ෂයන්ට අදාල ක්‍රියාකාරී සැලැස්ම සකස් කර 2021.12.01 දින පැවති ජාත්‍යන්තර වින්දිත දින සැමරුම් උත්සවයේදී ගරු අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිනියට හා අමාත්‍යාංශ ලේකම්තුමා වෙත පිරිනැමීම සිදු කරන ලදි.






2022 – 2024 වර්ෂයන් සඳහා මාර්ග රිය අනතුරු අවම කිරීමට අදාලව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ගරු අමාත්‍යතුමියට පිළිගැන්වීම.

❖ **මාර්ග රිය අනතුරු අවම කිරීම මූලික කර ගනිමින් පර්යේෂණ සිදු කිරීම.**

මාර්ග රිය අනතුරු අවම කිරීම කර ගනිමින් පර්යේෂණ 03 ක් සිදු කිරීමට සැලසුම් කර ඇති අතර, එහි පළමු පර්යේෂණය ලෙස ‘‘යතුරුපැදි අනතුරු අවම කිරීම’’ සඳහා පර්යේෂණ දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය සඳහා යොමු කර ඇති අතර, දෙවන පර්යේෂණය ලෙස ‘‘මහමඟදී පදිකයින් මිය යාම’’ පිළිබඳව මූලික කටයුතු ආරම්භ කර ඇත.

❖ **මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මාර්ග ආරක්ෂණ අරමුදල වර්ධනය කිරීම**

මාර්ග ආරක්ෂණ අරමුදල වෙත රක්ෂණ ආයතන විසින් මෙතෙක් ප්‍රේෂණය කරනු ලැබූ 1% ක දායකත්ව මුදල ගරු අමාත්‍යතුමියගේ අත්සනින් අංක 2245/31 හා 2021.10.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් බලාත්මක වන පරිදි 2% දක්වා වැඩි කිරීමට කටයුතු කරන ලදි.



- **මාර්ග රිය අනතුරු දත්ත කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.**

  ශ්‍රී ලංකා රථවාහන පොලිස් මූලස්ථානය මගින් බස්නාහිර සහ මධ්‍යම පළාත් තුළ දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා දත්ත විශ්ලේෂණ කළමනාකරණ පද්ධතිය දිවයින පුරා ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය රුපියල් මිලියන 37.99 ක මුදලකින් යුත් තාක්ෂණික උපකරණ ශ්‍රී ලංකා රථ වාහන පොලිස් මූලස්ථානය වෙත ලබා දීම සඳහා ව්‍යාපෘති වාර්තාව සකස් කර ප්‍රවාහන අමාත්‍යාංශය මගින් මුදල් අමාත්‍යාංශයට යොමු කර අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.





රථවාහන පොලිස් මූලස්ථානයේ ස්ථාපිත කර ඇති දත්ත පද්ධතිය පරීක්ෂාවට ලක් කිරීම

- **මාර්ග ආරක්ෂාවට අදාල විද්‍යුත් පුස්තකාලයක් ස්ථාපිත කිරීම (E-Library)**

  ශ්‍රී ලංකාවේ සිදු වන මාර්ග රිය අනතුරු පිළිබඳ තොරතුරු, වාර්තා, දත්ත, අන්තර් ජාතික රිය අනතුරු වාර්තා සහ දත්ත , ශ්‍රී ලංකාවේ රථ වාහන ප්‍රමාණයන් සහ ඒවායේ සංයුතියන් පිළිබඳව පරිශීලනය කිරීම සඳහා විද්‍යුත් පුස්තකාලයක් (E-Library) ස්ථාපිත කිරීම 2021.12.01 වන දින පැවති ජාත්‍යන්තර වින්දිත දිනයේදී සිදු කරන ලදි.



මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ විද්‍යුත් පුස්තකාලයක් ස්ථාපිත කිරීම

➢ **ආරක්ෂණ මාර්ග පද්ධතියක් ඇති කිරීම.**

❖ **රිය අනතුරු බහුල ස්ථානවල (Blackspot) හා ප්‍රසිද්ධ ස්ථානවල දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම.**

මාර්ග රිය අනතුරු දත්ත විශ්ලේෂණය කිරීමේදි දීර්ඝ කාලයක් තුළ මාර්ග රිය අනතුරු බහුලව සිදුවන ස්ථානයන් හඳුනාගෙන එම අනතුරු අවම කර ගැනීම සඳහා, මහජනතාව බහුලව ගැවසෙන ස්ථානයන් ආශ්‍රිතව දැනුවත් කිරීමේ පුවරු ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මන්නාරම් දිස්ත්‍රික්කයේ මඩු පල්ලියට යන ප්‍රධාන මාර්ගය අසල , කොළඹ ප්‍රධාන ලංගම බස් නැවතුම් පොළ අසල හා යාපනයේ ප්‍රධාන ලංගම බස් නැවතුම් පොළ අසල පුවරු 2 බැගින් ස්ථාන 03 පුවරු සවි කිරීම සිදු කරන ලදි.



මඩු පල්ලියට යන ප්‍රධාන මාර්ගය අසල



කොළඹ ප්‍රධාන ලංගම බස් නැවතුම් පොළ අසල



යාපනය ප්‍රධාන ලංගම බස් නැවතුම් පොළ අසල

❖ **දුම්රිය මගීන්ගේ සහ දුම්රිය හරස් මාර්ගය භාවිත කරනු ලබන පදිකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

දුම්රිය මගින්ගේ හා දුම්රිය හරස් මාර්ග භාවිත කරන පදිකයින් රිය අනතුරුවලට ලක්වීම වළක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේතුව මගින් හඳුනාගත් දුම්රිය අනතුරු බහුලව සිදුවන ස්ථානයන් වල දැනුවත් කිරීමේ පුවරු ස්ථාපිත කිරීම යටතේ මේ වන විට හඳුනාගත් දුම්රිය ස්ථාන 90 ක පුවරු 180 ක් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.







දුම්රිය හරස් මාර්ග ආසන්නයේ දැනුවත් කිරීමේ පුවරු ස්ථාපිත කිරීම - කොළොන්නාව

➢ මාර්ගය භාවිත කරන්නන්ගේ ආරක්ෂාව

❖ මාර්ග ආරක්ෂණ ළමා උද්‍යාන වැඩසටහන.

ළමා උද්‍යානයට අවශ්‍ය පාපැදි මේ වන විට මිලදී ගෙන ඇති අතර,කොළඹ මහ නගර සභාව වෙත ලබා දීමට නියමිතය.

❖ ‘‘පාසල් මාර්ග ආරක්ෂණ කලාප’’ වැඩසටහන සහ දැනුවත් කිරීමේ වැඩසටහන

මාර්ග රිය අනතුරු බහුලව සිදුවන ප්‍රදේශයන් හි තෝරා ගත් පාසල සහ අවට පාසල් 10 ක සිසු සිසුවියන්ගේ හා ගුරුවරුන්ගේ සහභාගිත්වය ඇතිව ‘‘ පාසල් මාර්ග ආරක්ෂණ කලාප’’ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

මෙම වැඩසටහන මගින් මාර්ග සංඥා සළකුණු පිළිබඳව ළමුන් දැනුවත්භාවයක් ලබාදීම සඳහා පාසල තුළ හා පාසල අවට පුවරු ස්ථාපිත කිරීම,විද්වත් දේශන මගින් මාර්ග ආරක්ෂාව පිළිබඳව ළමුන්ව දැනුවත් කිරීම,අනතුරක් සිදු වූ අවස්ථාවේදී ලබා දිය යුතු නිවැරදි ප්‍රථමාධාර පිළිබඳ දැනුවත් කිරීම හා සහභාගි වන ළමුන් සඳහා ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය කිරීම සිදු කරන ලදි.





ධර්මසේන ආටිගල විද්‍යාලය - කැස්බෑව



ධර්මසේන ආටිගල විද්‍යාලය - කැස්බෑව

❖ **මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සේවය ලබා දෙන පුද්ගලයින් සහ ආයතන ඇගයීම.**

2021 නොවැම්බර් මස තුන්වැනි සතියට යෙදී තිබූ ජාත්‍යන්තර වින්දිතයන්ගේ දිනයට සමගාමීව 2021.12.01 වන දින මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් පවත්වන ලද වැඩසටහනේදී මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සේවය ලබා දෙන පුද්ගලයින් 09 දෙනෙකුට සහ ආයතන 02 ක් ඇතුළුව 11 සඳහා ඇගයීම ගරු ප්‍රවාහන අමාත්‍ය ප්‍රවීන්ද්‍ර වන්නිආරච්චි මැතිනියගේ ප්‍රධානත්වයෙන් හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ හා සම්භාවනීය අමුත්තන්ගේ සහභාගීත්වයෙන් මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේදී සිදු කරන ලදි.







මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සේවය ලබා දෙන පුද්ගලයින් ඇගයීම

❖ **අධික වේගය නිසා සිදුවන මාර්ග අනතුරු අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

රජයේ ගිණුම් කාරක සභාව විසින් ලබාදී ඇති නියෝග ක්‍රියාත්මක කිරීම යටතේ ශ්‍රී ලංකා පොලිසිය වෙත තාක්ෂණික උපකරණ ලබා දීම. මෙහිදී ලේසර් ටෘකැම් වේග මාපක, අඳුරු විදුරු පරීක්ෂා කිරීමේ ලුමිනස් මීටර් හා ශබ්දය පරීක්ෂා කිරීමේ නොයිස් මීටර් ලබා දීමට නියමිතය.

❖ **මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් රිය අනතුරුවලට වැඩි වශයෙන් මුහුණපාන යතුරුපැදිකරුවන්ගේ ජීවිත ආරක්ෂාව සඳහා SLS 517 ප්‍රමිතියෙන් යුත් හිස් ආවරණයේ ඇති වැදගත්කමත්, යතුරුපැදි ධාවනය කිරීමේදී දැනගත යුතු කරුණු පිළිබඳව සකස් කරන ලද අත්පත්‍රිකා මගින් දීපව්‍යාප්තව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. මේ සඳහා ගරු ප්‍රවාහන අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා, ලසන්ත අලගියවන්න මැතිතුමා හා ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්තුමා හා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ, සභාපතිතුමා හා ලේකම්තුමා ද සහභාගී විය.





❖ **හඳුනා නොගත් රිය අනතුරු පිළිබඳව දැනුවත් කිරීම.**

හඳුනා නොගත් රිය අනතුරු සඳහා මූල්‍ය සහන යෝජනා ක්‍රමය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ පුවරු 500 ක් උතුරු නැගෙනහිර පළාත් පොලිස් ස්ථාන හැර අනෙකුත් සියලු පොලිස් ස්ථානවලට යොමු කර ඇති අතර, උතුරු නැගෙනහිර පළාත් පොලිස් ස්ථාන හා සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ලබා දීමට අවශ්‍ය පුවරු 550 ක් සකස් කර ඇති අතර, එය ලබාදීමට නියමිතය.



❖ **අධිවේගී මාර්ගය භාවිත කරන රියදුරන් දැනුවත් කිරීම.**

මාර්ග අනතුරු සම්බන්ධයෙන් අධිවේගී මාර්ගය භාවිත කරන රියදුරන් දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදා දීම කොට්ටාව අධිවේගී පිවිසුම් මාර්ගයේදී සිදු කරන ලදි.







කොට්ටාව අධිවේගී මාර්ග පිවිසුමේදී අත්පත්‍රිකා බෙදා දීම

❖ **සමාජ මාධ්‍ය ජාලා (Youtube , Twitter) වැනි ක්‍රමවේද ඔස්සේ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

කාර්ය බහුල ජීවන රටාවකට යොමු වී ඇති ජනතාව රිය අනතුරු අවම කිරීම කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්, රිය අනතුරු දත්ත, රිය අනතුරු බහුලව සිදුවන ස්ථානයන් පිළිබඳව, සම්මුඛ සාකච්ඡා ආදිය උපයෝගි කර ගනිමින් සමාජ මාධ්‍ය ජාලා (Facebook, YouTube Chanel, Instagram, Twitter) මගින් ප්‍රචාරය කිරීම, ජාත්‍යන්තර වින්දිත දිනයට සමගාමීව 2021.12.01 වන දින මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේදී පැවති උත්සවයේදි ගරු ප්‍රවාහන අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිනියගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදි. එමෙන්ම කෙටි වීඩියෝ පට 04 ක් විද්‍යුත් මාධ්‍ය මගින් මේ වන විට ප්‍රචාරය වෙමින් පවතී.





සමාජ මාධ්‍ය ජාලා ක්‍රියාත්මක කිරීම පිළිබඳව ගරු අමාත්‍යතුමිය දැනුවත් කිරීම





❖ **කෙටි වීඩියෝපට මඟින් දැනුවත් කිරීම.**

මාර්ග අනතුරු අවම කිරීම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සඳහා කෙටි වීඩියෝපට 06 ක් සකස් කර විද්‍යුත් මධ්‍ය හරහා ප්‍රචාරය කිරීම සිදු කරන ලදි. ඒ සඳහා

මිලියන 3.06 මුදලක් වැය කරන ලදි.







❖ **කෙටි පණිවිඩ (SMS) මඟින් යතුරුපැදි ලාභීන් දැනුවත් කිරීම.**

කෙටි පණිවිඩ (SMS) හරහා නවක යතුරුපැදි බලපත්‍රලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන් මෝටර් රථ දෙපාර්තමේන්තුව සමග එක්ව ක්‍රියාත්මක කිරීම.

රියදුරු බලපත්‍රය ඉල්ලුම් කළ පසු යැවීමට නියමිත කෙටි පණිවුඩය



රියදුරු බලපත්‍රය ලබාගත් පසු යැවීමට නියමිත කෙටි පණිවුඩය



❖ **මත්ද්‍රව්‍ය භාවිත කර රිය ධාවනය කරන රියදුරන් හඳුනා ගැනීමේ උපකරණ කට්ටල ශ්‍රී ලංකා පොලිසියට ලබාදීම.**

මත්ද්‍රව්‍ය භාවිත කර රිය ධාවනය කරන රියදුරන් හඳුනා ගැනීමේ උපකරණ කට්ටල (Test Kit) මිලදී ගැනීම සඳහා රාජ්‍ය ආරක්ෂක හා අපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත රු.මි. 10 ක මුදලක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් ලබාදීමට කටයුතු කර ඇත.





❖ **ග්‍රාමීය මාර්ග ආශ්‍රිතව සිදුවන මාර්ග අනතුරු අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

දකුණු හා වයඹ පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරීන් මඟින් අනතුරු බහුල ග්‍රාමීය මාර්ග වල ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇති යෝජනා වලට අදාලව සංඥා පුවරු ස්ථාපිත කිරීම ආරම්භ කර ඇත.



අම්බලන්තොට ඔබේසේකර පාසල අසල



වීරකැටිය වලස්මුල්ලපැස්සපිටිය මාර්ගය

❖ **වනජීවීන් පාර මාරුවන ස්ථාන ආශ්‍රිතව සිදුවන මාර්ග රිය අනතුරු අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

වනජීවීන් පාර මාරු වන ස්ථාන වල බහුල ලෙස මාර්ග රිය අනතුරු වන බව වනජීවී දෙපාර්තමේන්තුව විසින් විවිධ අවස්ථාවන්වලදී මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව දැනුවත් කර ඇත.

තවද මාර්ග සංවර්ධන අධිකාරීය මඟින් මාර්ග ආරක්ෂණ විගණනයෙන් හඳුනාගෙන ජාතික සභාව වෙත යොමු කළ, වනජීවීන් පාර මාරුවන ස්ථාව වල දැනුවත් කිරීමේ පුවරු ස්ථාපිත කිරීමට අදාල ඉදිරි ප්‍රසම්පාදන කටයුතු සඳහා අමාත්‍යාංශයේ අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිතය.







දඹුල්ල බකමූන කලගහවිල



යාල

❖ **රක්ෂණාවරණ නොලබන හප්පා පලායාම නිසා වින්දිත භාවයට පත්වන්නන් සඳහා මූල්‍ය සහන ලබාදීම.**

ස්ථාවර කමිටුවේ සහ ජාතික සභාවේ අනුමැතිය ලද වින්දිතයින් සඳහා 2021 වර්ෂයට අදාලව මූල්‍ය සහන ලබාදීම සිදු වූ අතර, එවකට සිටි ප්‍රවාහන අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා වර්තමාන ප්‍රවාහන අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිනියගේ ප්‍රධානත්වයෙන් මූල්‍ය සහන ලබා දීම සිදු කරන ලදි.

අනු අංකය	වර්ෂය	කාරනය	ප්‍රමාණය	මුදල
1	2021	බරපතල තුවාල	26	2,575,000.00
2		මරණ	19	3,800,000.00
		මුළු මුදල	45	6,375,000.00



වින්දිත භාවයට ලක්වන්නන් සඳහා මූල්‍ය සහන ලබාදීම.
මාකුමුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය

❖ **මූල්‍ය සහන ලබා දීම පිළිබඳව දැනුවත් කිරීම.**

හප්පා පලා ගිය වාහන වලින් විනිදිත භාවයට පත් වූවන් සඳහා මූල්‍ය සහන ලබා දීම පිළිබඳව පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් ලබා දීම ඊසි ටීවී (EASY TV)) මගින් සිදු කරන ලදි.







2021 වර්ෂයේ දිවයිනේ සිදු වූ රිය අනතුරු ප්‍රමාණය

වර්ෂය	මාරක	බරපතල	සුළු	අලාභ	එකතුව	මියගිය
2021	2414	6401	8070	5434	**22319**	2513

මූලාශ්‍රය - රථ වාහන පොලිස් මූලස්ථානය

මාර්ගය පරිහරණය කරන්නන් අනුව මියගිය සංඛ්‍යාව

මාර්ගය පරිහරණය කරන්නන්	**2021**
යතුරුපැදි කරුවන්	1124
පදිකයින්	612
පාපැදි කරුවන්	182
මඟින්	264
රියදුරන්	298

මූලාශ්‍රය - රථ වාහන පොලිස් මූලස්ථානය

2021 වර්ෂය තුල මාරක අනතුරු වලට වගකිව යුතු වාහන

වගකිවයුතු වාහනය	අනතුරු සංඛ්‍යාව
යතුරුපැදි	911
ලොරි	376
ත්‍රිරෝද රථ	330
ද්විත්ව කාර්ය වාහන	321
මෝටර් රථ	177
පුද්ගලික බස්	129
ලංගම බස්	37
ට්‍රැක්ටර්	30
පාපැදි	22
කන්ටේනර්	35
ඉඩම් වාහන	13
හප්පා පලා යෑම්	33

මූලාශ්‍රය - රථ වාහන පොලිස් මූලස්ථානය

මාර්ග ආරක්ෂණ අරමුදලට දායකත්වය සපයනු ලබන ලියාපදිංචි රක්ෂණ ආයතන.

01. අමානා ටකාෆුල් රක්ෂණ සමාගම	-	නො 660 1/1, ගාලු පාර, කොළඹ - 03.
02. අලියාන්ස් රක්ෂණ සමාගම	-	නො 675, ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ - 09.
03. සෙලින්කෝ රක්ෂණ සමාගම	-	3 වන මහල, ''සෙලින්කෝ නිවාස'', නො 69, ජනාධිපති මාවත, කොළඹ - 01.
04. කොන්ටිනෙන්ටල් රක්ෂණ සමාගම	-	නො 79, සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මාවත, කොළඹ - 07
05. සී./ස. සමූපාකාර රක්ෂණ සමාගම	-	''රක්ෂණ නිවාස'',නො 74/05, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ - 14.
06. එච්.එන්.බී. රක්ෂණ සමාගම	-	ව්‍යාපාර මධ්‍යස්ථානය,නො 30, ශ්‍රී උත්තරානන්ද මාවත, කොළඹ - 03.
07. එල්.ඕ.එල්.සී. රක්ෂණ සමාගම	-	නො 481, ටී.බී ජයා මාවත, කොළඹ - 10.
08. ජාතික රක්ෂණ භාර අරමුදල	-	නො 95, UPTO හවුස්, ශ්‍රී චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ -02.
09. එම්.බී.එස්.එල් රක්ෂණ සමාගම	-	අංක 519, ටී.බී ජයා මාවත,කොළඹ - 10
10. ඔරියන්ට් රක්ෂණ සමාගම	-	අංක.133, නව බුලර්ස් පාර,කොළඹ 04.
11. පීපල්ස් රක්ෂණ සමාගම	-	නො 07,හැව්ලොක් පාර, කොළඹ - 05.
12. සී/ස සණස රක්ෂණ සමාගම	-	නො 172, ඇල්විටිගල මාවත, කොළඹ - 08.
13. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම	-	රක්ෂණ මන්දිරය, නො 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02
14. ෆෙයාෆස්ට් රක්ෂණ සමාගම	-	ඇක්සස් ටවර් 2, නො 278/4, යුනියන් ප්ලේස්, කොළඹ 02.

වාර්ෂික ගිණුම් - 2021

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
2021 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

	සටහන්	2021 රු.	2020 (නැවත ප්‍රකාශ කළ) රු.
ආදායම			
රක්ෂණ සමාගම් වෙතින් ලද දායකත්වය	3	51,719,745.46	43,863,780.39
වෙනත් ආදායම්	4	22,577,038.49	27,368,261.35
මුළු ආදායම		**74,296,783.95**	**71,232,041.74**
වියදම් අඩුකළා			
පරිපාලන වියදම්	5.1	8,064,887.54	5,093,174.62
මාර්ග ආරක්ෂාව කළමනාකරන වැඩසටහන්	5.2	40,233,821.35	4,275,000.00
වියදමට වඩා ආදායමේ අතිරික්තය		**25,998,075.06**	**61,863,867.12**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
2021 දෙසැම්බර් 31 වැනි දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2021	2020
			නැවත ප්‍රකාශ කරන ලද
වත්කම්		රු	රු
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	6	5,306,508.68	6,497,516.50
මුළු ජංගම නොවන වත්කම්		**5,306,508.68**	**6,497,516.50**
භාණ්ඩාගාර බිල්පත්	7	282,381,122.40	269,074,920.47
ස්ථාවර තැන්පතු	8	177,523,869.46	142,801,605.20
ජංගම වත්කම්			
රක්ෂණ සමාගම් වලින් ලැබිය යුතු	3	7,037,439.32	3,882,145.32
භාණ්ඩාගාර බිල්පත් සඳහා ලැබිය යුතු පොළිය	7	1,763,859.33	1,362,012.58
ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළී	8	4,278,193.42	4,771,789.38
පූර්ව ගෙවීම්		133,375.08	25,640.03
බැංකුගත මුදල්	9	31,111,579.92	55,271,347.81
මුළු ජංගම වත්කම්		**44,324,447.07**	**65,312,935.12**
ජංගම බැඳීම් අඩුකළා			
ගෙවියයුතු විගණන ගාස්තු		200,000.00	338,000.00
ගෙවියයුතු වෙනත් ගෙවීම්		32,818.91	43,923.65
		232,818.91	381,923.65
මුළු වත්කම්		**509,303,128.70**	**483,305,053.64**
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදල් ගිණුම			
අරමුදල් ගිණුමේ ශේෂය ඉදිරියට ගෙනාවා		483,305,053.64	421,441,186.52
වියදමට වඩා ආදායමේ අතිරික්තය		25,998,075.06	61,863,867.12
මුළු අරමුදල්		**509,303,128.70**	**483,305,053.64**

සුවිශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 5 සිට 14 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලටම අයත් කොටස් වේ.

සහතික කිරීම

ඉහත මූල්‍ය ප්‍රකාශන මගින් 2021 දෙසැම්බර් 31 දින දක්වා වන කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බව සහ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන අතිරික්තය /(හිඟය) අපි සහතික කරමු. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මෙම සභාව වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන සභාව විසින් අනුමත කර අත්සන් කරන ලදී.

Dr. (Mrs.) K.S.M. Samaraweera
Chief Medical Officer
M.B.B.S. (SGMC) D.T.M.&H. (Ceylon)
S.L.M.O. (H.S.) Gr. I
National Transport Medical Institute
No. 170, Hugh Lewis Road
Narahenpita

Director
Road Safety & Traffic Management Division
National Transport Development Authority

R.L. Anton De Mens
Chairman
National Council for Road Safety
Ministry of Transport
No.01
D.R. Wijewardhana Mawatha
Colombo - 10.

ගණනකාධිකාරී (වැඩ ආවරණ)
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

H. P. S. Rathnayake
Accountant
Ministry of Vehicle Regulation, Sri Lanka Transport Services and Tourism and Motor Car Industry
3rd Floor, Sethsiripaya (Phase II)

සභාපති
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා
වක්‍ර ක්‍රම මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2021	2020 (Restated)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	**RS.**	**RS.**
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව	**25,998,075.06**	**61,863,867.12**
ගැලපීම්		
පූර්ව වර්ෂයේ ගැලපීම් (ශුද්ධ)		
අවප්‍රමාණවීම	1,231,331.82	1,230,021.59
ස්ථාවර වත්කම් ප්‍රදාන	-	-
පොලී ආදායම	(22,577,038.49)	(27,368,261.35)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	4,652,368.39	35,725,627.35
වෙනත් ලැබිය යුතු ලැබීම් වල වැඩිවීම/(අඩුවීම)	(3,171,279.84)	(2,621,888.70)
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ගෙවීම් වල වැඩිවීම/(අඩුවීම)	(149,104.74)	(107,327.36)
මෙහෙයුම් වලින් ජනිත වූ මුදල්	1,331,983.81	32,996,411.29
මෙහෙයුම් වලින් ජනිත වූ ශුද්ධ මුදල	1,331,983.81	32,996,411.29
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මූල්‍ය ප්‍රවාහය		
දේපල පිරියත හා උපකරණ මිළට ගැනීම	(40,324.00)	-
ලැබූ පොළිය	22,577,038.49	27,368,261.35
ස්ථාවර තැන්පත් ප්‍රති ආයෝජන	(34,722,264.26)	(51,194,871.93)
භාණ්ඩාගාර බිල්පත් ප්‍රති ආයෝජන	(13,306,201.93)	(16,776,952.07)
ආයෝජන කටයුතු සඳහා භාවිත ශුද්ධ මුදල	(25,491,751.69)	(40,603,562.65)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීමෙන් ලැබෙන මුදල්	-	-
දිගුකාලීන ණය ගැනීම් වලින් ලැබෙන මුදල්	-	-
මූල්‍ය බදු බැඳීම් ගෙවීම	-	-
ලාභාංශ ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිත ශුද්ධ මුදල	-	-
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම	**(24,159,767.89)**	**(7,607,151.40)**
කාලසීමාව ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ	**55,271,347.81**	**62,878,499.21**
කාලසීමාව අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ	**31,111,579.92**	**55,271,347.81**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
2021 දෙසැම්බර් 31 දිනට
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	අරමුදල් ගිණුම රු.	එකතුව රු.
2017/01/01 දිනට ශේෂය	260,040,799.57	260,040,799.57
		-
වියදමට වඩා ආදායමේ අතිරික්තය	40,561,344.97	40,561,344.97
2017/12/31 දිනට ශේෂය	300,602,144.54	300,602,144.54
වියදමට වඩා ආදායමේ අතිරික්තය (නැවත ප්‍රකාශ කිරීම)	59,487,763.56	59,487,763.56
2018/12/31 දිනට ශේෂය	360,125,892.14	360,125,892.14
වියදමට වඩා ආදායමේ අතිරික්තය (නැවත ප්‍රකාශ කිරීම)	61,315,294.39	61,315,294.39
2019/12/31 දිනට ශේෂය (නැවත ප්‍රකාශ කිරීම)	421,441,186.52	421,441,186.52
වියදමට වඩා ආදායමේ අතිරික්තය (නැවත ප්‍රකාශ කිරීම)	61,863,867.12	61,863,867.12
2020/12/31 දිනට ශේෂය	483,305,053.64	483,305,053.64
වියදමට වඩා ආදායමේ අතිරික්තය	25,998,075.06	25,998,075.06
2021/12/31 දිනට ශේෂය	509,303,128.70	509,303,128.70

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
2021 දෙසැම්බර් 31 දිනට
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

1. ආයතනික තොරතුරු

1.1 පොදු තොරතුරු

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මෝටර් රථ වාහන (සංශෝධිත) පනත මගින් පිහිටුවන ලද ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ලියාපදිංචි කාර්යාලය අංක 01, ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10 ස්ථානයේ පිහිටි අමාත්‍යාංශ ගොඩනැගිල්ලෙහි ස්ථාපිතව ඇත.

2 . සුවිශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් මුදල් ඒකකයෙන් ඉදිරිපත් කර ඇති අතර ඒවා ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් සකස් කළ, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රකාරව ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර තිබේ.

2.1.2 අනුකූලතා ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 වන දිනට හා එදිනෙන් අවසන්වූ වර්ෂය සඳහා වන මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය,සම කොටස් හා මුදල් ප්‍රවාහවල වෙනස්කම් සහ සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර තිබේ.

2.2 වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම

2.2.1 දේපළ, පිරියත, උපකරණ

(a)දේපල, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම් අඩු කර පිරිවැයට අනුව සටහන් කෙරේ.2018 දී වත්කම් නැවත ඇගයීමක් සිදු කළ අතර එම දිනයේ තිබූ වත්කම් වලින් සමුච්චිත ක්ෂය අඩුකර නැවත ඇගයීම් කළ වටිනාකමට අනුව පවත්වාගෙන යනු ලැබේ.

b) ක්ෂය වීම

ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සරල රේඛා පදනමක් භාවිතා කිරීමෙනි වත්කම ඵලදායී අයුරින් භාවිතයට ගතහැකි දිනයේ සිට ගණනය කරනු ලබන, වත්කමේ ඵලදායී ආයු කාලය පුරා මෙම ප්‍රතිපත්තිය අදාළ කර ඇත.

ප්‍රධාන වාර්ෂික ගාස්තු පහත පරිදි භාවිතා වේ.

1.	පරිගණක	25%
2.	ඡායාපිටපත් / මුද්‍රණ යන්ත්‍රය	12.5%
3.	වායු සමීකරණය	12.5%
4.	යන්ත්‍ර හා වෙනත් දේපල	12.5%
5.	ගෘහ භාණ්ඩ සහ උපාංග	10%
6.	රියදුරු ඉගෙනුම් යන්ත්‍ර	10%
7.	කැමරා උපකරණ සහ ශීතකරණ	25%

දේපළ, පිරියත සහ උපකරණවල ක්ෂයවීම් අනුපාත

2.3 ආයෝජන

මාර්ග ආරක්ෂණ අරමුදලට දායක මුදල් මාසික පදනම්න් රක්ෂණ සමාගම් වෙතින් ලැබෙන අතර අමතර අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල සහ ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කෙරේ.

(a) වර්තමාන ආයෝජන

වත්මන් ආයෝජන පිරිවැය මත ප්‍රකාශ කර ඇති අතර භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබෙන පොලී ආදායම නැවත කල් පිරෙන විට ආයෝජනය කෙරේ.

2.4 <u>වගකීම් සහ ප්‍රතිපාදන</u>

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්මන් වගකීම් යටතේ ප්‍රකාශ කර ඇති වගකීම් යනු මූල්‍ය තත්වයේ දිනයේ සිට වසරක් ඇතුළත ගෙවීම් කාලය කල්පිරෙන බව අපේක්ෂා කරන බැඳීම් වේ.

2.4. 1 <u>ගෙවිය යුතු වෙනත් ගෙවීම්</u>

ණයහිමියන් සහ අනෙකුත් ගෙවිය යුතු දේ ඔවුන්ට අදාලව පොත් වල දැක්වෙන වටිනාකම් වලින් දක්වා ඇත.

2.4.2 ප්‍රතිපාදන

සම්පත් පිටතට ගලායාමකට හේතුවන පරිදි, පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සභාවට වර්තමාන වගකීමක් ඇති විට ප්‍රතිපාදන හඳුනා ගැනේ.

ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කිරීම වගකීම් නිරවුල්කිරීමට ආර්ථික ප්‍රතිලාභ අවශ්‍ය වනු ඇති අතර වගකීම් ප්‍රමාණය අනුව විශ්වාසනීය ඇස්තමේන්තු කිරීමක් සිදු කළ හැක.

2.5 මාර්ග ආරක්ෂණ අරමුදලේ ආදායම්

ලියාපදිංචි වාහන රක්ෂණ සමාගම් 14ක් සියලුම තුන්වන පාර්ශ්ව රක්ෂණ ඔප්පු වලින් 1%ක් ලබා දී ඇත.
2021 ඔක්තෝබර් 01 සිට එය 2% දක්වා වර්ධනය කර ඇත. රක්ෂණ සමාගම් ඔවුන් ගෙවිය යුතු මාසික දායකත්ව වාරික ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර ගෙවිය යුතුය.

2.6 කාර්ය මණ්ඩල

ජාතික මාර්ග ආරක්ෂණ ලේකම් කාර්යාලය යනු මාර්ග ආරක්ෂාව පිළිබඳ වන ජාතික සභාව ක්‍රියාත්මක කිරීමේ ආයතනයයි. අනෙකුත් සභායක කාර්ය මණ්ඩලය අමාත්‍යාංශයෙන් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලයට මාරු කර එවා ඇත. ප්‍රවාහන අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ වැටුප ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ගෙවනු ලැබේ.

2.7දෝෂ

ජාතික සභාවේ පළමු මුල්‍ය ප්‍රකාශන කට්ටලයේ අතීතානුයෝගීව දක්වා ඇති නිවැරදි පූර්ව කාල මූර්ත දෝෂ පහත සඳහන් දේ තුළින් අනාවරණය කර ගැනීමෙන් පසු නිකුත් කිරීම සඳහා අවසර දී ඇත.

(ඒ)දෝෂ සිදුව ඇති, ඉදිරිපත් කරන ලද පූර්ව කාල පරිච්ඡේද සඳහා සංසන්දනාත්මක ප්‍රමාණයන් නැවත සඳහන් කිරීම;

(බී) හෝ ඉදිරිපත් කරන ලද මුල්ම පූර්ව කාල පරිච්ඡේදයට පෙර දෝෂය සිදු වූයේ නම්, ඉදිරිපත් කරන ලද
මුල්ම පූර්ව කාල පරිච්ඡේදය සඳහා අදාල වත්කම්, වගකීම් සහ ශුද්ධ ත්කම්/සම කොටස්වල ආරම්භක ශේෂයන් නැවත සඳහන් කිරීම.

මෙම වසර තුළදී පෙර මූල්‍ය ප්‍රකාශයේ යම් යම් දෝෂ හමු වූ අතර, ඒවා 2020 මුල්‍ය ප්‍රකාශනය තුළ නැවත ප්‍රකාශ කිරීමෙන් නිවැරදි කරන ලදී. දෝෂයේ ස්වභාවය, 2020 දී කලින් ඉදිරිපත් කරන ලද සහ නැවත ප්‍රකාශ කිරීම මගින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මත ඇතිවූ බලපෑමට අදාල ශේෂයන් පහතින් සාරාංශ කර ඇත.

2020 වර්ෂයේ දෝෂ නිවැරදි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ වෙනස්වීම් වල බලපෑම සහ මූල්‍ය කාර්ය
සාධන ප්‍රකාශය මත එහි බලපෑම

අයිතමය	සටහන	නැවත ප්‍රකාශ කිරීමට පෙර ශේෂය	ගැලපීම	නැවත ප්‍රකාශ කළශේෂය
ආදායම				
රක්ෂණ දායකත්ව	2.7 .1	43,768,526.82	95,253.57	43,863,780.39

	සටහන	නැවත ප්‍රකාශ කිරීමට පෙර ශේෂය	ගැලපීම	නැවත ප්‍රකාශ කළශේෂය
වියදම්				
දුරකථන ගාස්තු	2.7.2	192,797.37	(9,462.14)	183,335.23
මුද්‍රණය සහ පරිවර්තනය	2.7.2	178,103.50	(5,800.00)	56,437.50
අතිකාල ගාස්තු	2.7.2	141,586.34	(7,236.62)	134,350.22
පුවත්පත්	2.7.2	83,790.00	(10,710.00)	73,080.00
පිරිසිදු කිරීමේ ගාස්තු	2.7.2	653,373.26	(62,592.75)	590,780.51
ක්ෂය වීම	2.7.3	1,294,171.59	(64,150.00)	1,230,021.59

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මත බලපෑම

අයිතමය	**සටහන**	**නැවත ප්‍රකාශ කිරීමට පෙර ශේෂය**	**ගැලපීම**	**නැවත ප්‍රකාශ කළ ශේෂය**
රක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු ලැබීම්	2.7.1	3,786,891.75	95,253.57	3,882,145.32
දේපල පිරියත හා උපකරණ	2.7.3	6,433,366.50	64,150.00	6,497,516.50

2.7.1 –J/E 17

2020 දෙසැම්බර් 31 වන දිනට රක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු දායකත්වය රු. 3,882,145.32 වන අතර, එය රුපියල් 3,786,891.75 ක් ලෙස වැරදි ලෙස 2020 මූල්‍ය ප්‍රකාශනයෙහි. සටහන් විය. මෙය 2020 මූල්‍ය ප්‍රකාශනවල නැවත ප්‍රකාශ කිරීමෙන් නිවැරදි කරන ලදී.

2.7.1 –J/E 18

2019 මූල්‍ය වර්ෂයේ සිදු වූ වියදම් වැරදි ලෙස 2020 වර්ෂයේ වියදම ලෙස සටහන් කර ඇත. 2020 මූල්‍ය ප්‍රකාශය තුළ නැවත ප්‍රකාශ කිරීම මගින් නිවැරදි කර ඇත.

2.7.1 –J/E 19

ගෘහ භාණ්ඩ සහ උපාංගවල ක්ෂය වීම 2020 දී රුපියල් 64,150.00 ක වැඩි අගයකින් යුතුව සටහන් කර ඇති අතර, 2020 මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කිරීම මගින් නිවැරදි කරනු ලැබේ.

3. 2021 සඳහා රක්ෂණ සමාගම් වෙතින් ලැබුණු දායකත්වය

	සටහන් අංකය	2021	2020 (නැවත ප්‍රකාශ කළ)
		රු.	රු.
වසර තුළ රක්ෂණ දායකත්ව ලැබීම්	3.1	48,564,451.46	43,642,940.75
රක්ෂණ දායකත්ව එකතු කළා		7,037,439.32	3,882,145.32
		55,601,890.78	47,525,086.07
LESS			
ලැබිය යුතු රක්ෂණ දායකත්ව ආරම්භක ශේෂයෙන් අඩු කළා		3,882,145.32	3,661,305.68
		51,719,745.46	**43,863,780.39**

3.1 වසර තුළ රක්ෂණ දායකත්ව ලැබීම්

රක්ෂණ සමාගමේ නම	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
එච්.එන්.බී රක්ෂණ සමාගම	100,680.00	97,860.00	96,820.00	100,945.00	66,325.00	76,300.00	95,415.00	140,055.00	-	178,630.00	208,040.00	217,545.00	1,378,615.00
සීමාසහිත අමානා තකාපුල් රක්ෂණ සමාගම	204,694.91	123,489.10	117,269.61	132,068.47	90,539.99	67,435.89	-	291,638.69	138,787.92	266,730.96	-	616,464.45	2,049,119.99
සෙලින්කෝ රක්ෂණ සමාගම	339,345.84	405,268.00	375,551.00	369,658.33	242,277.80	252,830.19	311,662.06	561,670.68	339,693.00	299,575.15	1,010,562.00	805,202.66	5,313,296.71
එම් බී එස් එල් රක්ෂණ සමාගම	-	138,882.99	-	-	58,452.40	-	-	-	124,880.02	216,772.74	-	90,377.00	629,365.15
සමුපකාර රක්ෂණ සමාගම	133,311.00	339,409.00	329,770.00	288,170.00	197,888.00	184,681.00	292,478.00	544,738.00	313,020.00	240,626.00	1,089,187.00	897,357.00	4,850,635.00
ඔරියන්ටි රක්ෂණ සමාගම	-	457,120.00	130,510.00	117,320.00	92,575.00	-	183,580.00	136,140.00	-	215,310.00	183,141.48	176,616.72	1,692,313.20
සණස රක්ෂණ සමාගම	107,660.70	109,441.44	109,926.57	102,226.24	70,528.21	56,560.27	96,994.81	157,626.86	87,803.98	70,093.75	300,936.16	254,518.02	1,524,317.01
ආලියාන්ස් ලංකා සමාගම	699,125.00	244,960.00	229,220.00	215,680.00	144,655.00	154,165.00	-	509,475.00	213,800.00	185,580.00	535,460.00	458,100.00	3,590,220.00
ශ්‍රී ලංකා රක්ෂණ සමාගම	839,487.00	855,791.00	835,063.00	761,048.00	527,499.00	524,993.00	745,256.00	1,192,085.00	667,010.00	588,740.00	2,246,962.00	1,783,693.00	11,567,627.00
පීපල්ස් ඉන්ෂුවරන්ස් රක්ෂණ සමාගම	162,466.32	218,651.56	183,248.68	188,602.17	108,074.78	112,459.34	150,475.37	179,103.62	167,618.88	194,181.29	387,583.06	300,820.53	2,353,285.60
කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම	95,615.00	90,930.00	93,276.00	68,791.00	73,383.00	66,273.00	90,489.00	111,743.00	89,973.00	83,416.00	144,963.00	135,022.00	1,143,874.00
ලංකා ඔරික්ස් ලීසින් රක්ෂණ සමාගම	110,175.00	520,295.00	-	243,050.00	-	582,825.00	323,085.00	-	-	1,292,181.00	494,268.00	423,830.00	3,989,709.00
ජාතික රක්ෂණ භාර අරමුදල	58,559.55	23,108.95	25,981.70	-	39,168.30	121,901.80	-	9,546.35	-	-	48,910.10	22,320.05	349,496.80
ෆෙයාෆර්ස්ට් රක්ෂණ සමාගම	1,031,025.00	1,024,115.00	1,006,705.00	400,786.00	272,083.00	349,293.00	384,657.00	613,136.00	434,928.00	748,247.00	941,482.00	926,120.00	8,132,577.00

04. වෙනත් ආදායම්

	සටහන	**2021**	**2020** (නැවත ප්‍රකාශ කළ)
		රු.	රු.
භාණ්ඩාගාර බිල්පත් පොලී	7	13,708,048.68	16,200,634.75
ස්ථාවර තැන්පතු පොලී	8	8,868,989.82	11,167,626.60
		22,577,038.49	27,368,261.35

05. වියදම්

5.1 පරිපාලන වියදම්

	2021	**2020 (Restated)**
	රු.ශ	රු.ශ.
වැටුප් සහ වේතන	899,700.00	809,925.00
ඉන්ධන දීමනාව	308,730.00	251,510.08
වෙනත් දීමනා	982,080.51	863,300.80
ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	403,647.57	87,500.00
සභා සහ කමිටු සාමාජික ගාස්තු	443,000.00	201,500.00
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තුව	791,052.25	298,986.92
වාහන නඩත්තුව	14,732.05	13,717.01
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	169,268.15	159,280.00
විදුලිය, දුරකථන සහ ජලය	151,695.04	183,335.23
පුවත්පත්	68,240.00	73,080.00
මුද්‍රණය සහ පරිවර්තනය	746,892.50	56,437.50
අනිකාල ගාස්තු	365,197.65	134,350.22
රැස්වීම් සඳහා සංග්‍රහ	51,793.00	78,607.67
විගණන ගාස්තු		
මෙම වසර සඳහා විගණන ගාස්තු	200,000.00	170,000.00
පෙර වර්ෂයේ ඌන (අධික) ප්‍රතිපාදන	22,600.00	(207,000.00)
ගමන් වියදම්	294,872.00	31,535.00
ක්ෂය	1,231,331.82	1,230,021.59
තැපැල් ගාස්තු	17,715.00	3,720.00
කාර්ය මණ්ඩල පුහුණුව	16,000.00	-
පුහුණුලාභී දීමනා	7,500.00	-
පිරිසිදු කිරීමේ ගාස්තු	734,400.00	590,780.51
විවිධ වියදම්	144,440.00	62,587.10
	8,064,887.54	**5,093,174.62**

5.2 මාර්ග ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන් සඳහා වියදම්

සටහන්	**2021** රු.	**2020** රු.
මාර්ග ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන්	33,858,821.35	-
හප්පා පළා යාම් සඳහා වන්දි	6,375,000.00	4,275,000.00
	40,233,821.35	**4,275,000.00**

5.2.1 මාර්ග ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන් සඳහා වියදම්

වැඩසටහන	**2021** රු
මාර්ග ආරක්ෂණ කළමනාකරණයේ ධාරිතාව වැඩි කිරීම	107,127.00
ආරක්ෂිත මාර්ග පද්ධතියක් නිර්මාණය කිරීම	7,781,651.00
මාර්ග භාවිත කරන්නන්ගේ විනය ගොඩනැගීම	25,970,043.35
	33,858,821.35

06. දේපල, පිරියත සහ උපකරණ

	පරිගණක	ඡායාපිටපත් / මුද්‍රණ යන්ත්‍රය	ගෘහ භාණ්ඩ සහ උපාංග	වායු සමීකරණ	මාධ්‍ය උපකරණ	වෙනත් වත්කම්	රිය පැදවීම ඉගෙනුම් යන්ත්‍ර	ශීතක	එකතුව
පිරිවැය / නැවත ඇගයීම	**රු.**	**රු.**	**රු.**	**රු.**	**රු.**	**රු.**	**රු.**	**රු.**	**රු.**
2021.01.01 දිනට ශේෂය (නැවත ප්‍රකාශිත)	713,500.00	140,700.00	641,500.00	139,800.00	1,554,862.50	62,207.50	5,875,351.00	133,000.00	9,260,921.00
වර්ෂය තුළ									-
එකතු කිරීම	-	-	-	-	22,550.00	17,774.00	-	-	40,324.00
බැහැර කිරීම්	-	-	-	-	-	-	-	-	-
2021.12.31 දිනට ශේෂය	**713,500.00**	**140,700.00**	**641,500.00**	**139,800.00**	**1,577,412.50**	**79,981.50**	**5,875,351.00**	**133,000.00**	**9,301,245.00**
සමුච්චිත ක්ෂය									
2021.01.01 දිනට ශේෂය (නැවත ප්‍රකාශිත)	507,161.25	50,564.06	295,090.00	50,240.63	579,407.02	30,771.48	1,207,263.90	42,906.16	2,763,404.50
වසර සඳහා අය කිරීම	178,375.00	17,587.50	64,150.00	17,475.00	326,356.82	6,602.40	587,535.10	33,250.00	1,231,331.82
2021.12.31 දිනට ශේෂය	**685,536.25**	**68,151.56**	**359,240.00**	**67,715.63**	**905,763.84**	**37,373.88**	**1,794,799.00**	**76,156.16**	**3,994,736.32**
ශුද්ධ පොත් වටිනාකම									
2021.12.31 දිනට	206,338.75	90,135.94	346,410.00	89,559.37	975,455.48	31,436.02	4,668,087.10	90,093.84	6,497,516.50
2021.12.31 දිනට	**27,963.75**	**72,548.44**	**282,260.00**	**72,084.37**	**671,648.66**	**42,607.62**	**4,080,552.00**	**56,843.84**	**5,306,508.68**

6.1 සම්පූර්ණයෙන් අගය ක්ෂය වූ භාවිතයේ ඇති දේපල, පිරියත සහ උපකරණ

සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම්වල භාවිතයේ පවතින සම්පූර්ණ අවප්‍රමාණය වත්කම් PPE හි ඇතුළත් වේ. වාර්තා කරන දිනට තවමත් භාවිතයේ පවතින සම්පූර්ණ අවප්‍රමාණය වූ වත්කම්වල පිරිවැය/ප්‍රති තක්සේරුව අනුව වටිනාකම පහත පරිදි වේ.

	2021	**2020**
	රු.	**රු.**
වෙනත් වත්කම	41,914.69	41,914.69

07. භාණ්ඩාගාර බිල්පත්

බිල්පත් අංකය	**2021** දෙසැම්බර් **31** දිනට ආයෝජනය කළ මුදල	**2021** වසර සඳහා පොලී ආදායම	**2021** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතු පොළිය
1	12,797,283.29	625,600.32	49,466.24
2	43,898,668.03	2,207,491.97	
3	7,662,586.15	374,587.97	29,618.73
4	11,275,586.62	551,211.98	43,584.32
5	19,987,147.88	937,764.29	86,483.90
6	819,961.09	38,469.98	3,547.95
7	30,529,240.10	1,551,374.55	412,151.18
8	13,725,015.14	635,401.71	250,742.90
9	9,964,776.60	487,132.17	38,517.55
10	101,081,518.19	4,742,582.83	437,377.25
11	30,501,085.88	1,549,945.13	411,771.09
12	87,146.95	4,088.46	377.08
13	51,106.48	2,397.33	221.14
එකතුව	**282,381,122.40**	**13,708,048.68**	**1,763,859.33**

08. ස්ථාවර තැන්පතු

ස්ථාවර තැන්පතු අංකය	ගිණුම් අංකය	මුදල	**2021** වසර සඳහා පොලී ආදායම	**2021** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතු පොලී ආදායම
1	5052659	10,000,000.00	457,401.06	40,277.78
2	6462242	3,000,000.00	137,269.40	6,666.67
3	6061516	1,000,000.00	45,817.73	3,194.44
4	83251129	37,783,177.89	1,843,584.70	479,555.72
5	83250939	51,549,239.52	2,726,064.48	683,557.04
6	321362	48,191,452.05	2,666,803.66	2,072,892.60
7	204-60-01-00026713-3	26,000,000.00	992,049.18	992,049.18
		177,523,869.46	**8,868,989.82**	**4,278,193.42**

09. බැංකුගත මුදල්	**2021**	**2020**
	රු.	**රු.**
බැංකු ශේෂය	31,111,579.92	55,221,484.39
හඳුනා නොගත් ලැබීම්	-	49,863.42
බැංකුගත මුදල්	31,111,579.92	55,271,347.81

විගණකාධිපති වාර්තාව -2021

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } සිඔවි/සි/එන්.සි.ආර්.එස්/එෆ්.ඒස්/2021/එෆ්.ඒ

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2022 මැයි 31 දින

සභාපති,

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනයකළ මතය සඳහා පදනම

ඡංක 1368/18 හා 2004 නොවැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම සභාව වෙත රක්ෂණ ආයතන විසින් ප්‍රේෂණය කරතිබූ රු.51,719,745 ක් වූ සියයට 02 හි දායකත්වය හි නිවැරදිතාවය පිළිබඳ තහවුරුවන රක්ෂණ සමාගම්හි කොමිස් ආදායම් ගණනය කිරීම් විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනයකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සභාවේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු සභාවේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණනපරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදනඇතුලත්වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමාකිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව හා සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයටයොමුව	විස්තරය
(අ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 8(1) වගන්තිය හා PED 12 රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 5.2.4 වගන්තිය	මුදල් වර්ෂය ආරම්භ වීමට පෙර මාස 03 කට ප්‍රථම අයවැය ලේඛනය අනුමත කල යුතු වුවත් සභාව විසින් අයවැය ලේඛනය අනුමත කර තිබුණේ 2021 ජනවාරි 13 දිනදීය.
(ආ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය. 4.2.6 වගන්තිය	කාර්තු , අර්ධවාර්ෂික , වාර්ෂික වශයෙන් ආයතනයේ කාර්ය සාධනය වාර්තා සමාලෝචනය කලයුතු වුවද සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 1998 අංක 05 දරණ මොටර් වාහන පනතින් සංශෝධිත පනතේ (203 වන අධිකාරිය) මගින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂම ස්ථාපනය කිරීම අරමුණු කොටගෙන ජාතික සභාව පිහිටුවා වසර 15 ක් ගත වී ඇතත් කොමිෂමක් ලෙස ස්ථාපිත නොවීම හේතුවෙන් මෙම සභාවේ කාර්යයන් ඉටුකිරීමට නීතිමය බලතල ලැබී නොතිබුණු අතර විධිමත් කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීමට එය බාධාවක්ව තිබුණි.

(ආ) අංක 1387/4 හා 2005 අප්‍රේල් 04 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පවරා තිබූ කාර්යය වලින් රථ වාහන ප්‍රමාණය ඒවායේ ලක්ෂණ හා සංයුතිය, මාර්ග අනතුරු හා මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සංඛ්‍යා තොරතුරු ඇතුලත් පරිගණක දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම,මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යාම, සම්බන්ධිත විෂයයන් පිළිබඳ පර්යේෂණවලට ආධාර කිරීම,සමාන ජාත්‍යන්තර ආයතන සමඟ සබඳතා පැවත්වීම දැනුම හුවමාරු කර ගැනීම,මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම,රජය හා රාජ්‍ය නොවන සංවිධාන තුල මාර්ග ආරක්ෂාව සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සහ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳ රජයට උපදෙස් ලබාදීම යන කාර්යයන් ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සැකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

03. අනෙකුත් විගණන නිරීක්ෂණ.

(අ) රජයේ ගිණුම් කාරක සභාව විසින් ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂයේ ජුලි මස සංශෝධිත අයවැය ලේඛනය හා සංශෝධිත ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර අධික වේගය නිසා සිදුවන මාර්ග අනතුරු අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණු නමුත් 2021 වර්ෂය සඳහා ප්‍රතිපාදනය කල රු.මිලියන 150 ක මුදල අදාල කාර්යයට යොදවා නොතිබු බැවින් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. මේ හේතුවෙන් සභාව 2021 සඳහා සකස් කල

සංශෝධිත අයවැය හා ක්‍රියාකාරී සැලැස්ම ඵලදායී පාලන කාරකයක් ලෙස යොදවා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.එසේම සභාව විසින් මාර්ග ආරක්ෂාව සඳහා නව ඵලදායී වැඩසටහන් හඳුන්වා දී අනතුරු අවම කිරීමට නව යෝජනා ඉදිරිපත් කර ක්‍රියාත්මක කරනු වෙනුවට පෙර වර්ෂ වලට අදාල ක්‍රියාත්මක කිරීමට අපෙහොසත් වූ වැඩසටහන් හා ව්‍යාපෘති 2021 වර්ෂයේදී නැවතත් ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රක්ෂණ ආයතනවලින් රු. 51,719,745 ක දායක මුදල් ලැබී තිබූ අතර ඉන් රු.6,375,000 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණු එම මුදල ලැබීම්වලින් සියයට 13 ක් විය. ශ්‍රී ලංකාව තුල සිදුවන වාහන අනතුරු සඳහා වන්දි මුදල් ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳව මහජනතාවගේ නොදැනුවත්භාවය හේතු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක එන්පි/5පි/5ඩිජී/17 දරන වක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඈ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ශක්තිමත් කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් හා අවශ්‍ය යටිතල පහසුකම් සපුරාගත යුතු වුවද, සභාවේ කටයුතු ප්‍රවාහන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්ත නිලධාරීන් හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරියෙකුගෙන් හා අනියම් කම්කරුවකුවන් යොදවා කරගෙන ගොස් තිබුණි.

(ඉ) 2018 දෙසැම්බර් මස ජපන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ හා මිලදී ගෙන තිබූ රු. 5,875,351 ක් වටිනා රියැදුරු පුහුණු උපකරණ වලින් රියැදුරු පුහුණු කිරීම් සාර්ථකව සිදුකර නොතිබූ අතර 2019 ජූනි 21 දිනෙන් පසු පුහුණු කටයුතු නවතා දමා තිබීම හේතුවෙන් එම උපකරණ නිශ්කාර්යව පැවැතුණි.

ඩබලිව්.පී.සී. වික්‍රමරත්න,
විගණකාධිපති.

<u>මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.</u>

<u>නීතිරීති විධිවිධාන යොමුව</u>

(අ)1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය හා PED 12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 වගන්තිය.

2023 වර්ෂයට අදාල අයවැය ලේඛනය 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව 2023 මුදල් වර්ෂය ආරම්භවීමට මාස 03කට පෙර අනුමත කරගැනීමට කටයුතු කරමින් පවති.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක PED /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. 4.2.6 වගන්තිය.

2021 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2022 අනුව කාර්ය මණ්ඩලය ආයතනයට කැඳවීම් සීමා කර තිබීම හේතුකොට ගෙන 2022 අගෝස්තු 24 තෙක් ප්‍රගති සමාලෝචන රැස්වීම් නිසිපරිදි පැවැත්වීමට නොහැකි වුවද මින් ඉදිරියට 2003 ජුනි 02 දිනැති චක්‍රලේඛයේ 4.2.6 වගන්ති ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. ඒ අනුව 2022 වර්ෂය සඳහා පළමු ප්‍රගති සමාලෝචන රැස්වීම 2022.09.15 දින පවත්වන ලදි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර, සභාවේ කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
(අ) 1998 අංක 05 දරන මෝටර් වාහන පනතින් සංශෝධිත පනතේ (203 වන අධිකාරිය) මගින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂම ස්ථාපිත කිරීම අරමුණු කොට ගෙන ජාතික සභාව පිහිටුවා වසර 15 ක් ගත වී ඇතත්, කොමිෂමක් ලෙස ස්ථාපිත නොවීම හේතුවෙන් මෙම සභාවේ කාර්යයන් ඉටුකිරීමට නිතිමය බලතල ලැබී නොතිබුණු අතර, විධිමත් කාර්යය මණ්ඩලයක් පත්කර ගැනීමට එය බාධාවක්ව තිබුණි.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ජාතික ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ කොමිෂන් සභාව ලෙස ස්ථාපිත කිරීමට අදාලව සකස් කරන ලද පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමෙන් අනතුරුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධන සහිතව 2022.05.18 දින නැවත ප්‍රවාහන අමාත්‍යාංශය වෙත යොමු කර, නිරීක්ෂණ විමසා තිබූ අතර නිරීක්ෂණ නොමැති හෙයින් ඉදිරි කටයුතු සිදුකරන ලෙස අමාත්‍යාංශය මගින් දැනුම් දී ඇත.

ඒ අනුව, සකස් කරන ලද පනත් කෙටුම්පතෙහි ව්‍යවස්ථානුකූල භාවය පරීක්ෂා කිරීම සඳහා 2022.10.11 වන දින ප්‍රවාහන අමාත්‍යාංශය මගින් නීතිපති වෙත යොමු කර ඇති අතර, මෝටර් වාහන පනතේ 213A හා 213B ඉවත් කිරීමට අදාලව මෝටර් වාහන පනතේ පවතින විධිවිධාන සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබාගැනීම සඳහා මෝටර්රථ කොමසාරිස් ජනරල් වෙත යොමු කර ඇත.

එමෙන්ම, 2022.10.11 වන දින ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමන් විසින් පනත් කෙටුම්පතට නව සංශෝධනයන් 2ක් එක් කරන ලෙස ලබාදුන් උපදෙස් අනුව ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත නැවත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමට අමාත්‍යාංශ නීති අංශය මගින් කටයුතු කරමින් පවති.

(ආ) අංක 1387/4 හා 2005 අප්‍රේල් 04 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පවරා තිබූ කාර්යය වලින් රථ වාහන ප්‍රමාණය, ඒවායේ ලක්ෂණ හා සංයුති,ය මාර්ග අනතුරු හා මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සංඛ්‍යා තොරතුරු ඇතුලත් පරිගණක දත්ත ගබඩාවත් පවත්වාගෙන යාම, මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යාම, සම්බන්ධිත විෂයයන් පිළිබඳ පර්යේෂණ වලට ආධාර කිරීම, සමාන ජාත්‍යන්තර ආයතන සමඟ සබඳතා පැවැත්වීම, දැනුම හුවමාරු කර ගැනීම,මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සකස් කිරීම හා ක්‍රියාවට නැන්වීම, රජය හා රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සහ මාර්ග ආරක්ෂාව සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳ රජයට උපදෙස් ලබාදීම යන කාර්යයන් ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

රථ වාහන ප්‍රමාණය සම්බන්ධයෙන් දත්ත ලබාගැනීම සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ විද්‍යුත් පුස්තකාලය හරහා මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තුමේන්තුවේ දත්ත ගබඩාවට ප්‍රවේශයක් ලබා දී ඇති අතර, මාර්ග රිය අනතුරු සම්බන්ධ දත්ත ලබාගැනීමට ශ්‍රී ලංකා පොලිසියේ දත්ත ගබඩාවට ප්‍රවේශක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. එසේම 2022 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මේ දත්ත කළමනාකරණ පද්ධතිය සම්බන්ධයෙන් ඇති ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කරමින් පවති.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සැකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

2023 වසරේ සිට ඉදිරියට සිදුකරනු ලබන සියලුම ප්‍රසම්පාදන කටයුතු නියමිත නීතිරීතිවලට අනුකූලව හා නියමිත කාලසීමාවන් තුළදී කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටුකිරීමට කටයුතු කරමි.

03. <u>අනෙකුත් විගණන නිරීක්ෂණ.</u>

(අ) රජයේ ගිණුම් කාරක සභාව විසින් ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂයේ ජුලි මස සංශෝධිත අයවැය ලේඛනය හා සංශෝධිත ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර අධික වේගය නිසා සිදු වන මාර්ග අනතුරු අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණ නමුත් 2021 වර්ෂය සඳහා ප්‍රතිපාදනය කළ රු මිලියන 150 ක මුදල අදාල කාර්යයන්ට යොදවා නොතිබූ බැවින්, මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.මේ හේතුවෙන් සභාව 2021 සඳහා සකස් කළ සංශෝධිත අයවැය හා ක්‍රියාකාරී සැලැස්ම ඵලදායි පාලන කාරකයක් ලෙස යොදවා ගෙන නොතිබූණු බව නිරීක්ෂණය විය. එසේම සභාව විසින් මාර්ග ආරක්ෂාව සඳහා නව ඵලදායි වැඩසටහන් හඳුන්වා දී අනතුරු අවම කිරීමට නව යෝජනා ඉදිරිපත් කර ක්‍රියාත්මක කරනු වෙනුවට පෙර වර්ෂ වලට අදාල ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ වැඩසටහන් හා ව්‍යාපෘති 2021 වර්ෂයේදී නැවතත් ක්‍රියාත්මක කර තිබුණි.

මාර්ග රියඅනතුරු අවමකරගැනීම සඳහා ශ්‍රී ලංකා පොලීසියට උපකරණ ලබාදීම, රජයේ ගිණුම්කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීමක් වන මේ වන විට ලංසු කැඳවීම සඳහා වන වාර්තා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ උපදෙස් අනුව සකස්කරමින් පවති.

එසේ සකස් කරන ලද ලංසු කැඳවීමේ ලේඛන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කිරීමෙන් අනතුරුව පෙන්වා දුන් සංශෝධනයන්ට යටත්ව, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නැවත සකස් කරමින් පවති.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රක්ෂණ ආයතන වලින් රු 51,719,745 ක දායක මුදල් ලැබී තිබූ අතර, ඉන් රු 6,375,000 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණු එම මුදල ලැබීම් වලින් 13% ක් විය. ශ්‍රී ලංකාව තුළ සිදුවන වාහන අනතුරු සඳහා වන්දි මුදල් ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව මහජනතාවගේ නොදැනුවත්භාවය හේතු වී ඇත බව විගණනයේදී නිරීක්ෂණය විය.

හදුනා නොගත් වාහනවලින් සිදුවන අනතුරු සඳහා මූල්‍ය සහන ලබාදීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රමානුකූලව වැඩිකරමින් පවතින අතර අනතුරු දත්ත ශ්‍රී ලංකා පොලිසියට වාර්තා වන ප්‍රමාණයට වඩා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට යොමුවන ප්‍රවණතාවයක් පවති.වන්දි අයදුම් ලැබීම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

වර්ෂය	ලද අයදුම්පත් සංඛ්‍යාව	අනුමත වූ අයදුම්පත් සංඛ්‍යාව	ගෙවන ලද වාර්ෂික වන්දි මුද	පෙර වර්ෂයට සාපේක්ෂව අයදුම්පත් වැඩිවීම
2020	30	34	4,275,000.00	-
2021	61	64	9,375,000.00	103.3%
2022 සැප්තැම්බ	75	57	10,450,000.00	22%

2022 සැප්තැම්බර් මාසයෙන් පසුව, මූල්‍ය සහන ලබාදීම සඳහා අනුමත අයදුම්පත්‍ර 17ක් සඳහා රු.3,650,000.00ක මුදලක් ගෙවීමට කටයුතු කර ඇත.

(ඇ) 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක එන්පි/5පි/5ඩිජි/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්ගෙන් මාර්ග ආරක්ෂණයට අදාල අරමුණු 03 ක් හදුනාගෙන ඇති අතර, එම ඉලක්කයන් ළඟා කරගත හැකි වන පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ඇත.

(ඈ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ශක්තිමත් කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් හා අවශ්‍ය යටිතල පහසුකම් සපුරාගත යුතු වුවද , සභාවේ කටයුතු ප්‍රවාහන අමාත්‍යාංශය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අනුයුක්ත නිලධාරීන් හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරියෙකුගෙන් හා අනියම් කම්කරුවන් යොදවා කරගෙන ගොස් තිබුණි.

කාර්යමණ්ඩලයක් අනුමත කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කිරීමට අවශ්‍ය වාර්තා සැකසීම සම්බන්ධයෙන් 2022.09.06 වන දින ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම්(පාලන) සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර, එහිදී ලබාදුන් උපදෙස් පරිදි සකස් කරන ලද වාර්තා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට යොමුකිරීමට නියමිතය.

එසේ සකස් කරන ලද වාර්තා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට යොමු කිරීමට කටයුතු සිදු කළ අතර,මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බැවින්, අදාල වාර්තා ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශයට යොමු කර ඇත.

(ඉ) 2018 දෙසැම්බර් මස ජපන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ හා මිලදී ගෙන තිබූ රු 5,875,351 ක් වටිනා රියදුරු පුහුණු උපකරණ වලින් රියැදුරු පුහුණු කිරීම් සාර්ථකව සිදු කර නොතිබූ අතර, 2019 ජුනි 21 දිනෙන් පසු පුහුණු කටයුතු නවතා දමා තිබීම හේතුවෙන් එම උපකරණ නිශ්කාර්යව පැවතුණි.

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ඉල්ලීම පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සහ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව 2022.06.21 දිනට මිලියන 3.8ක ශුද්ධ වටිනාකම වූ උපකරණ කට්ටලය ඵලදායි ලෙස භාවිත කිරීම සදහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු පුහුණු පාසැල් වෙත 2022.06.22 දින භාරදෙන ලදී. තවද එම උපකරණ ඵලදායී ලෙස භාවිතා කරන්නේද? යන්න පිළිබඳව පසුවිපරම් වාර්තාවක් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.

ආර්.එල්.ඇන්ටන් ද මෙන්ස්,
සභාපති,
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.